Department Sabaragamuwa Province/ Weekly School Department of Education Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - ගිණුම්කරණය

සතිය - 7

ශ්‍රේණිය - 13

සකස් කළේ - කලාප අධ්‍යාපන කාර්යාලය,රත්නපුර.

නිපුණතාව 11.0 - මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත භාවිත කරයි.
නිපුණතා මට්ටම 11.7 - කල්බදු සඳහා ගිණුම්ගත කිරීම පිළිබඳ මූලික අවබෝධය ලබා ගනියි.

සීමිත අමන්දා පොදු සමාගම 2019.04.01 දින කල්බද්දක් මත යන්ත්‍රයක් අත්පත් කර ගන්නා ලදී.මෙම ගනුදෙනුවට අදාළ පහත තොරතුරු ලබා දී ඇත.

| | |
|---|---|
| යන්ත්‍රයේ සාධාරණ අගය | - රු.1,541,992 |
| මූලික ගෙවීම | - රු.400,000 |
| සෑම වසරකටම අග ගෙවිය යුතු කල්බදු වාරිකය | - රු.400,000 |
| කල්බදු කාලය | - වසර 4යි. |
| යන්ත්‍රයේ අවශේෂ අගය | - රු.41,992 |
| ඵලදායී ජීව කාලය | - වසර 5යි. |
| කල්බදු පොලී අනුපාතය වසරකට | -15%යි. |

බදු කාලය අවසානයේ යන්ත්‍රයේ අයිතිය සීමිත අමන්දා සමාගමට ලැබේ.
එක් එක් වසර අවසානයේ කල්බදු පොලිය පහත දැක්වේ.

| වසර | කල්බදු පොලිය රු. |
|---|---|
| 2019/2020 | 171,289 |
| 2020/2021 | 136,994 |
| 2021/2022 | 97,542 |
| 2022/2023 | 52,174 |
| මුළු පොලිය | 457,999 |

අවශ්‍ය වන්නේ,

1.2020/03/31න් අවසන් පළමු වසර සඳහා වාර්ෂික ක්ෂය ගිණුම් තැබීමද ඇතුළුව අදාළ ජර්නල් සටහන්
2. 2020/03/31න් අවසන් පළමු වසර සඳහා වාර්ෂික ක්ෂය ගිණුම් තැබීමද ඇතුළුව අදාළ ලෙජර් ගිණුම්
3.2020/03/31න් අවසන් වසරට අදාළව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු කල්බදු දේපළට අදාළ අයිතමයන්